ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2512/41 - 2026 ඔක්තෝබර් මස 30 වැනි සිකුරාදා - 2026.10.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත

10 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කරන ලද නියෝගය

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 10 වන වගන්තියේ (3) වන උපවගන්තිය මඟින් ජාතික ව්‍යසන කළමනාකරණ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, සහ **2026 ජූනි මස 13 දිනැති අමප/26/1247/803/038 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ලබා දී ඇති අනුමැතිය සැලකිල්ලට ගනිමින්**, අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථා විසින් ආයතනික ව්‍යසන කළමනාකරණ සැලසුම් සකස් කර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නියෝග කරනු ලැබේ:-

1. මෙම නියෝගය **"ආයතනික ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ නියෝගය, අංක 01/ 2026"** යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. සෑම අමාත්‍යාංශයක්, රජයේ දෙපාර්තමේන්තුවක් සහ රාජ්‍ය සංස්ථාවක් විසින්ම, තම ආයතනයට අදාළව ඇති හෝ ඇතිවිය හැකි කිසියම් ව්‍යසනයක් හෝ ආසන්න ව්‍යසන තත්ත්වයක් සඳහා ප්‍රතිචාර දැක්වීමට පෙර සූදානම් වී සිටීම පිණිස **ආයතනික ආපදා කළමනාකරණ සැලැස්මක් (Institutional Disaster Management Plan)** සකස් කළ යුතුය.

3. 2 වන ඡේදය යටතේ සකස් කරනු ලබන ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම, **ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම මත පදනම්ව National Disaster Management Plan (NDMP) සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් නිකුත් කරනු ලබන අදාළ මාර්ගෝපදේශවලට අනුකූලව** සකස් කළ යුතුය.

4. ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේදී, අදාළ ආයතනයේ කාර්යභාරය, වගකීම්, ව්‍යසන අවදානම්, අවදානමට ලක්විය හැකි කරුණු සහ අත්‍යවශ්‍ය සේවා සැලකිල්ලට ගනිමින්, ව්‍යසන අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම, ව්‍යසන වැළැක්වීම හා අවදානම් අවම කිරීම, සූදානම, හදිසි ප්‍රතිචාරය, අත්‍යවශ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම, සම්පත් කළමනාකරණය, සහන, ප්‍රතිසාධනය, පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය සහ සැලැස්ම සමාලෝචනය හා යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය විධිවිධාන ඇතුළත් කළ යුතුය.

5. 4 වන ඡේදයේ සඳහන් ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් නිකුත් කර ඇති **"Institutional Disaster Management Plan – Guidelines for Preparation – For All Ministries, Government Institutions, Departments and Agencies"** යන මාර්ගෝපදේශයට අනුකූලව සකස් කළ යුතුය.

6. සෑම අමාත්‍යාංශයක්, රජයේ දෙපාර්තමේන්තුවක් සහ රාජ්‍ය සංස්ථාවක් විසින්ම, මෙම නියෝගය *ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට **මාස තුනක කාල සීමාවක් ඇතුළත**, තම ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම සකස් කර **ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත** ඉදිරිපත් කළ යුතුය.

7. සෑම අමාත්‍යාංශයකම ලේකම්වරයා, සෑම රජයේ දෙපාර්තමේන්තුවකම ප්‍රධානියා සහ සෑම රාජ්‍ය සංස්ථාවකම ප්‍රධාන විධායක නිලධාරියා හෝ ආයතනයේ ප්‍රධානියා විසින් තම ආයතනයේ ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම මෙම නියෝගයට අනුකූලව සකස් කර නියමිත කාලසීමාව තුළ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කිරීම සහතික කළ යුතුය.

8. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් මෙම නියෝගය යටතේ ලැබෙන ආයතනික ආපදා කළමනාකරණ සැලසුම්, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 10 වන වගන්තියේ (4) වන උපවගන්තිය ප්‍රකාරව, ජාතික ව්‍යසන කළමනාකරණ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

9. සෑම අමාත්‍යාංශයක්, රජයේ දෙපාර්තමේන්තුවක් සහ රාජ්‍ය සංස්ථාවක් විසින්ම තම ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම, ආයතනයේ කාර්යභාරය, ව්‍යසන අවදානම්, ආයතනික ව්‍යුහය හෝ මෙහෙයුම් ක්‍රමවේදවල සැලකිය යුතු වෙනසක් සිදුවන අවස්ථාවකදී සහ ආයතනයට අවශ්‍ය යයි හැගෙන ඕනෑම අවස්ථාවකදී අවශ්‍ය පරිදි සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය. එලෙස යාවත්කාලීන කරන ලද පිටපත ද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලබාදීම සඳහා කටයුතු කළ යුතුය.

10. මෙම නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශ සහ සහාය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් අදාළ අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථා වෙත ලබා දිය හැකිය.

මෙම නියෝගය ව්‍යසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාවේ එකඟතාවය පරිදි 2026 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වන දින කොළඹදී සිදු කරන ලදී.

එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික)
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී//, ආර්එස්පී/, යූඑස්පී, එෆ්එන්ඩීයූ
(චීනය), පීඑස්සී
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය,
ලේකම්, ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව.

EOG 10 - 0369